# <u>ලී කෙළි නැටුම</u>



ගැමි නැටුම් අතර ඉතා ප්‍රචලිත නැටුමකි ලී කෙළි නැටුම. විනෝද උත්සව සඳහා භාවිතා කළ හැකි ලී කෙළි නැටුම ලී කැබලි 2 ක් ගෙන එකිකට තට්ටු කරමින් නටනු ලබයි.

ලී කැබලි කපා පිරිස එකතු කර  පසුව ඉදිරිපත් කරන අවස්ථාවේදී රසවත් කවි රාශියක් ලී කෙළි නැටුම සඳහා භාවිතා කරයි.

ලී කෙළි නැටුම ඉතා සරළ පද භාවිතා කරන අතර ලී කැබලි දෙක අත්‍යාවශ්‍ය වේ. විවිධ නාද මාලා අනුව කවි ගායනා කරනු ලබයි. ගැහැණු පිරිමි දෙපාර්ශවයම නර්තනය කරනු ලබයි. ඇඳුම් පැළඳුම් ඉතා සරළය.

## <u>ලී කෙළි කවි</u>

තන තන තම්දන තාන තනම්දන

තානත් තන තම්දන තා නා

තෙයි තන තම්දන තාන තනම්දන

තානත් තන තම්දන තා නා

පළමුව බුද්ධං සරණේ නමකර

දෙවනුව ධම්මං සරණේ නමකර

තෙවනුව සංඝං සරණේ නමකර

අඩිය තබන්නට මිහිකත් අවසර

අන්තර්ගතය : වී. ඒ. කේ. ප්‍රියංගිකා සංජීවනී, බප/කැල/ සාන්ත ප්‍රැන්සිස් ම.වි., කැළණිය

එක පඳුරෙන් ලී සයක් කපාගෙන

එක උස ඇති සඳෙනෙක් තෝරාගෙන

ගුරුන් අතට දී ලී බෙදවාගෙන

අපිත් කෙළිමු ලී දෙපිළ බෙදීගෙන

ඉරට ඔබින් ඉර මුදුනේ සිටියා

සඳට ඔබින් සඳ මුදුනේ සිටියා

ලියට ඔබින් සුදු සේලේ නෙරියා

අපිට ඔබින් සබ මැද ලී කෙළියා

අහසේ දෙවියන් රැස්ව සිටින්නයි

පොළවේ දෙවියන් බිම වැඳගන්නයි

සතරවටේ දෙවි බලා සිටින්නයි

අද ලී කෙළියෙන් අප දිනවන්නයි

National e-Learning Portal for the General Education

